## පළමුවන කියැවීම

ප්‍රඥ 2:12, 17-20

සලමොන්ගේ ප්‍රඥුව නමැති පොතෙන් ගත් පාඨයෙකි.

**"දැහැමියා ලජ්ජා සහිත මරණයට හෙළා දමමු."**

දැහැමියා අපට කරදර කරන බැවින් ද, අපේ ජීවිත ක්‍රමයට විරුද්ධ වන බැවින් ද, නීතිය කඩ කරන විට අපට දෙස් පවරන බැවින් ද, විනයට විරුද්ධව ක්‍රියා කිරීම ගැන අපට චෝදනා කරන බැවින් ද, අපි ඔහු එනතෙක් සැඟවී බලා සිටිමු. ඔහු පවසන දේ ඇත්තද කියා බලමු. ඔහුට ලැබෙන අන්තිමය කුමන එකක් ද කියා සෝදිසි කරමු. දැහැමියා දෙවිඳුන්ගේ පුත්‍රයා නම් දෙවිඳුන් ඔහුට පිහිට වී සතුරාගේ ග්‍රහණයෙන් ඔහු මුදනු ඇත. ඔහුට කෲර ලෙස වද දී ඔහු පරීක්ෂා කරමු. මෙලෙස ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය සොයා බලමු. ඔහුට ගැළවීම ලැබේ යයි ඔහු කියා සිටින හෙයින් ලජ්ජා සහිත මරණයකට ඔහු හෙළා දමමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 54:1-4, 6

පිළිතුර: දෙවිඳුණෝ මාගේ සහායට වඩින සේක.

ගීය: අහෝ දෙවිඳුනි, ඔබ නාමයේ අනුහසින් මා මුදාලුව මැනව. ඔබ බල මහිමයෙන් මා නිදහස් කළ මැනව. දෙවිඳුනි, මාගේ යැදුමට සවන් දුන මැනව. මා පවසන වදනට ද සවන් දුන මැනව.

විදේශිකයෝ මට විරුද්ධව නැගිට්ටෝය. සාහසිකයෝ මා මරන්නට සෙව්වෝ ය. මාගේ අධිපතියාණෝ දෙවිඳුන් බව ඔව්හු නොපිළිගත්තෝ ය. දෙවිඳුණෝ මාගේ සහායට වඩින සේක.

සමිඳුණෝ මාගේ දිවියට රැකවරණය දෙන සේක. තුටු පහටු සිතින් මම ඔබට පඬුර පුදන්නෙමි. සමිඳුනි, සැබැවින් ම ඔබ යහපත් බැවින් මම ඔබේ නාමය පසසන්නෙමි.

## දෙවන කියැවීම

ජාකොබ් 3:16-4:3

ශුද්ධ වූ ජාකොබ් තුමාගේ හසුනෙන් ගත් කොටසකි.

**"ධර්මිෂ්ඨකම සාම දූතයන් වපුළ බීජවලින් නිපදවන අස්වැන්නකි."**

ඊර්ෂ්‍යාවත් උන්නතිකාමයත් කොතැනද එතැන අවුල් වියවුල් ද සියලු නපුරු ක්‍රියා ද ඇත්තේ ය. එහෙත් ලෝකෝත්තර ප්‍රඥුව පළමුකොට නිර්මල ය. ඊළඟට සාමකාමී ය. සානුකම්පිත ය. යුක්ති සහගත ය. එය දයාවෙන් හා යහපත් ඵලවලින් හා පූර්ණ ව, පක්ෂවාදිකමින් ද කුහකකමින් ද තොරව පවතී. සැබෑ ධර්මිෂ්ඨකම සාම දූතයන්

සාමයෙන් වපුළ බීජවලින් නිපදවන අස්වැන්නකි. ඔබ අතර ආරවුල් හා කල කෝලාහල ඇති වන්නේ කෙසේ ද? ඒවා හට ගන්නේ ඔබගේ ඉඳුරන් තුළ සටන් කරන තෘෂ්ණාවලින් නොවේ ද? ඔබ යමකට ආසා වන්නහු ය. එහෙත් එය ඔබට ලැබෙන්නේ නැත. ඒ නිසා ඔබ මිනී මරන්නට පෙළඹෙන්නහු ය. ඔබ ඊර්ෂ්‍යා කරන්නහු ය. ඔබට තෘප්තියක් නැත. යාච්ඤාවෙන් නො ඉල්ලන නිසා ඔබ ආසා වන දෙය ඔබට ලැබෙන්නේ නැත. ඔබ යාච්ඤාවෙන් ඉල්ලුවත්, වැරදි ලෙස ද ආත්මාර්ථකාමී තෘප්තිය සඳහා ද ඉල්ලන බැවින් එය නොලැබෙන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ජුවාම් 8:12

ආලේලූයා! ආලේලූයා!
"ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 9:30-37

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ප්‍රථමයා වන්න කැමැත්තේ හැමගේ සේවකයා විය යුතු ය."**

ජේසුස් වහන්සේ හා ශ්‍රාවකයින් එතැනින් නික්ම ගලීලය මැදින් ගියහ. ඒ බව කිසිවෙකු දැනගැනීම උන් වහන්සේගේ කැමැත්ත නොවී ය. කුමක්නිසා ද, උන් වහන්සේ, "මනුෂ්‍ය-පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලබති; ඔව්හු එතුමාණන් මරන්නෝ ය. මරනු ලැබූ පසු එතුමාණෝ තෙදිනකින් නැවත නැගිටින්නාහ"යි ශ්‍රාවකයන්ට ඉගැන්වූ බැවිනි. එහෙත් ඒ කීම ඔවුන්ට අවබෝධ නො වී ය. උන් වහන්සේගෙන් අසන්නටත් ඔව්හු බිය වූ හ. ඔව්හු කපර්ණවුමට පැමිණියහ. උන් වහන්සේ ගෙයි සිටි කල, "ඔබ මඟ දී කුමක් ගැන විවාද කළහු දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. එහෙත් ඔව්හු නිහඬ වූ හ. මන්ද, වඩා උසස් කවරෙක් දැ යි මඟ දී තම තමන් අතර ඔවුන් විවාද කළ බැවිනි. එකල උන් වහන්සේ වැඩහිඳ දොළොස් දෙනා කැඳවා, "ප්‍රථමයා වන්න කැමැත්තේ හැමට ම අන්තිමයාත්, හැමගේ සේවකයාත් විය යුතු ය"යි ඔවුන්ට වදාළ සේක. උන් වහන්සේ කුඩා දරුවෙකු ගෙන ඔවුන් මැද සිටුවා ඔහු තුරුල් කරගෙන, "මෙබඳු කුඩා දරුවන්ගෙන් එකෙකු මාගේ නාමයෙන් පිළිගන්නා, මා පිළිගන්නේ ය. මා පිළිගන්නා, පිළිගන්නේ මා නොව, මා එවා වදාළ තැනැන් වහන්සේ ය"යි ඔවුන්ට වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.